# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනත

---

[සහතිකය සටහන් කළේ 1986 පෙබරවාරි මස 18 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1986 පෙබරවාරි මස 21 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වැනි කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැක

මිළ : ශත 90 යි | තැපැල් ගාස්තුව : ශත 75 යි

# 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනත

[සහතිකය සටහන් කළේ 1986 පෙබරවාරි මස 18 වන දින.]

එල්. ඩී.—ඕ. 8/83.

**චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය යනුවෙන් හඳුන්වනු ලබන භාරයක් පිහිටුවීම සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, එහි පරමාර්ථ හා බලතල නිශ්චය කිරීමට සහ ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1986 අංක 3 දරන චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. **ලුහුඬු නාමය.**

2. (1) (මෙහි මින් මතු "භාරය" යනුවෙන් සඳහන් කරනු ලබන) චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය යනුවෙන් හැඳින්වෙන භාරයක් පිහිටුවනු ලැබිය යුතුය. **චිත්‍රපට කලාකරුවන් හා චිත්‍රපට කාර්මිකයන් සඳහා වූ ජාතික චිත්‍රපට සංස්ථා භාරය පිහිටුවීම.**

(2) භාරය (1) වන උපවගන්තියෙන් ඊට පැවරී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් සහ පොදු මුද්‍රාවක් තිබිය යුතුය. තවද ඒ නාමයෙන් නඩු පැවරීම ද ඊට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකිය.

3. (1) භාරයෙහි පරිපාලනය, කළමනාකරණය සහ පාලනය මෙහි මින් මතු විධිවිධාන සලසා ඇති පරිදි සංස්ථාපනය කරන ලද භාරකාර මණ්ඩලයක් වෙත පැවරෙන්නේය. **භාරයේ භාරකාර මණ්ඩලය.**

(2) (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) භාරයේ භාරකාර මණ්ඩලය—

(අ) මණ්ඩලයේ සභාපතිවරයා විය යුතු චිත්‍රපට සංස්ථාවේ සභාපතිවරයාගෙන් ;

(ආ) චිත්‍රපට සංස්ථාවේ සාමාන්‍යාධිකාරිවරයාගෙන් ; සහ

(ඇ) (මෙහි මින් මතු "පත් කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන)—

(i) පත්කිරීමේ ලිපියෙහි, පිළිවෙළින්, මණ්ඩලයේ සාමාජිකයා සහ මණ්ඩලයේ විකල්ප සාමාජිකයා ලෙස පදවි නම් කරනු ලැබිය යුතු, චිත්‍රපට සංස්ථාවේ අධ්‍යක්ෂවරයන් දෙදෙනාගෙන් පළමුව නම් කරනු ලැබූ අධ්‍යක්ෂවරයා හෝ ඔහු පැමිණ නොසිටි අවස්ථාවක දෙවැනිව නම් කරනු ලැබූ අධ්‍යක්ෂවරයා හෝ විය යුතු එක් සාමාජිකයකුගෙන් ද ;

2- ඒ 087150—7,730 (85/11)

(ii) මහා භාණ්ඩාගාරයේ නියෝජිතයකු විය යුතු එක් සාමාජිකයකුගෙන් ද;

(iii) චිත්‍රපට කර්මාන්තයෙහි නියැලුණු තැනැත්තන් අතුරින් පිළිවෙළින් චිත්‍රපට කලාකරුවන්, චිත්‍රපට කාර්මිකයන් සහ චිත්‍රපට අධ්‍යක්ෂවරයන් නියෝජනය කරන්නා වූ සාමාජිකයන් තුන් දෙනකුගෙන් ද

යුතුව, අමාත්‍යවරයා විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් පස් දෙනකුගෙන්

සමන්විත විය යුතුය.

(3) මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකු ඉවත් කිරීම අවස්ථානුකූල යයි අමාත්‍යවරයා සලකතහොත් අමාත්‍යවරයා විසින් හේතුවක් නොදක්වාම ඒ සාමාජිකයා ඉවත් කරනු ලැබිය හැකි අතර, එවැනි ඉවත් කිරීමක් කවර හෝ අධිකරණයක දී ප්‍රශ්නයට භාජන නොකරනු ලැබිය යුතුය.

(4) මණ්ඩලයේ පත් කළ සාමාජිකයකුට ඕනෑම අවස්ථාවක දී අමාත්‍යවරයා වෙත යවනු ලබන ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකිය.

(5) රෝගාතුරවීම නිසා හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා හෝ වෙනත් යම් හේතුවක් නිසා හෝ තාවකාලිකව තම ධුරයේ කාර්ය ඉටු කිරීමට මණ්ඩලයේ යම් පත් කළ සාමාජිකයකුට නොහැකි වන අවස්ථාවක ඔහු වෙනුවට ක්‍රියා කිරීම සඳහා (2) වන උපවගන්තියේ (ඇ) ඡේදයේ විධි විධාන ගැන නිසි සැලකිල්ල ඇතිව වෙනත් තැනැත්තකු අමාත්‍ය වරයා විසින් පත් කරනු ලැබිය හැකිය.

(6) මණ්ඩලයේ සෑම පත් කළ සාමාජිකයෙක් ම, ස්වකීය ධුරය කලින් හිස් කරන්නේ නම් මිස, අවුරුදු තුනක කාලයක් ධුරය දරන්නේ ය:

එසේ වුවද පත් කළ සාමාජිකයකුගේ ධුරයෙහි පුරප්පාඩුවක් පිරවීම පිණිස අමාත්‍යවරයා විසින් පත් කරනු ලැබූ සාමාජිකයකු ස්වකීය ධුරය කලින් හිස් කරන්නේ නම් මිස, තමා යම් සාමාජිකයකුගේ අනුප්‍රාප්තිකයා වූයේ ද ඒ සාමාජිකයාගේ ධුර කාලයෙන් නොගෙවී ඇති කාලය තුළ ධුරය ඇරිය යුතුය.

(7) ස්වකීය ධුරය හිස් කරන යම් පත් කළ සාමාජිකයෙක් (3) වන උපවගන්තිය යටතේ ඉවත් කරනු ලැබ සිටී නම් මිස යළි පත් කරනු ලැබීමට සුදුසු වන්නේ ය.

(8) මණ්ඩලයේ පත් කළ සාමාජිකයකු—

(අ) මණ්ඩලයේ තමාගේ සාමාජිකත්වයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම මත ; හෝ

(ආ) චිත්‍රපට සංස්ථාවේ තමාගේ අධ්‍යක්ෂ ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කරනු ලැබීම මත ; හෝ

(ඇ) මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් හෝ චිත්‍රපට සංස්ථාවේ අධ්‍යක්ෂවරයකු වශයෙන් වූ තමාගේ ධුර කාලය අවසන් වීම මත

ධුරය හිස් කර ඇති ලෙස සලකනු ලැබිය යුතුය.

(9) මණ්ඩලයේ සභාපතිවරයා මණ්ඩලයේ සියලු රැස්වීම්වල දී මුලසුන දැරිය යුතුය. යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොසිටින විට, පැමිණ සිටින, (2) වන උපවගන්තියේ (ඇ) (i) ඡේදයෙහි සඳහන් කරන ලද සාමාජිකයා හෝ විකල්ප සාමාජිකයා රැස්වීමෙහි මුලසුන දැරිය යුතුය.

(10) මණ්ඩලයේ යම් රැස්වීමක මුලසුන දරන තැනැත්තාට තමාගේම ඡන්දයට අතිරේක වූ තීරක ඡන්දයක් ද තිබිය යුතුය.

(11) මණ්ඩලයේ සාමාජිකයන් අතර යම් මත භේදයක් ඇති අවස්ථාවක වැඩි දෙනාගේ තීරණය අනුගම්‍ය හා බලසහිත විය යුතුය.

(12) මණ්ඩලයේ රැස්වීමක් සඳහා ගණපූරණය සාමාජිකයන් හතර දෙනකු විය යුතුය.

(13) (12) වන උපවගන්තියේ විධිවිධානවලට යටත්ව මණ්ඩලයේ රැස්වීම් සහ ඒ රැස්වීම්වල දී කටයුතු කරගෙන යාම පිළිබඳ කාර්ය පටිපාටිය මණ්ඩලය විසින් විධිමත් කරනු ලැබිය හැකිය.

(14) මණ්ඩලයේ සාමාජිකයන් අතර පුරප්පාඩුවක් පැවතුන ද මණ්ඩලය විසින් ක්‍රියා කරනු ලැබිය හැකිය.

(15) මුදල් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අමාත්‍යවරයා විසින් නිරණය කරනු ලබන පාරිශ්‍රමික, දීමනා හෝ වෙනත් වියදම් මණ්ඩලයේ සියලු සාමාජිකයන්ට හෝ යම් සාමාජිකයකුට හෝ ගෙවනු ලැබිය හැකිය.

4. භාරයේ මුද්‍රාව— භාරයේ මුද්‍රාව.

(අ) මණ්ඩලය විසින් කලින් කල තීරණය කරනු ලබන තැනැත්තන්ගේ ආරක්ෂක භාරයෙහි තිබිය යුතුය ;

(ආ) මණ්ඩලය විසින් තීරණය කරනු ලබන ආකාරයට වෙනස් කරනු ලැබිය හැකිය ; තවද

(ඇ) මණ්ඩලයේ අනුමතය ඇතිව ද තමන් ඉදිරිපිටදී මුද්‍රාව තැබූ බවට සාධන පත්‍රයෙහි හෝ ලේඛනයෙහි අත්සන් තැබිය යුතු මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු ඉදිරිපිටදී ද හැර, කිසිදු සාධන පත්‍රයකට හෝ ලේඛනයකට නොතබනු ලැබිය යුතුය.

හාරයේ පරමාර්ථ.

5. භාරයේ පරමාර්ථ—

(1) චිත්‍රපට කලාකරුවන්ට හා කාර්මිකයන්ට ආධාර වන පරිදි සැලසුම් කරන ලද, දායක විශ්‍රාම වැටුප් ක්‍රම සකස් කිරීම, සහ සාධක අරමුදල්, ඉතිරි කිරීමේ අරමුදල්, ඉතිරි කිරීමේ හෝ සක්‍යුරුවම් සමිති සහ වෙනත් සමාන යෝජනා ක්‍රම පිහිටුවීම ;

(2) මණ්ඩලය වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට, සුදුසු කම් ලැබූ චිත්‍රපට කලාකරුවකුට හෝ කාර්මිකයකුට—

(අ) ඔහු වයසින් අවුරුදු හැටට එළඹීමෙන් පසුව නොකඩවා වෘත්තියෙහි නියැලී සිටිය ද නොසිටිය ද, ඔහු ඒ වයසට එළඹි විට විශ්‍රාම වැටුපක්, ණයක්, දීමනාවක්, නිවාස පහසුකමක් හෝ වෙනත් සමාන ප්‍රතිලාභයක් ඔහු වෙත පිරිනැමීම ;

(ආ) ඔහු යම් කායික හෝ මානසික අබලතාවකට පත්ව සිය වෘත්තියෙහි යෙදීමට නොහැකිව සිටී නම්, යම් මුදල් ආධාරයක් පිරිනැමීම ;

(3) සුදුසුකම් ලැබූ චිත්‍රපට කලාකරුවකු හෝ කාර්මිකයකු මිය ගිය විටක—

(අ) අවමංගල්‍ය වියදම් වෙනුවෙන් යම් මුදල් ආධාරයක් ;

(ආ) ඒ සුදුසුකම් ලැබූ චිත්‍රපට කලාකරුගේ හෝ කාර්මිකයාගේ වැන්දඹුවට, දෙමාපියන්ගෙන් කෙනකුට හෝ බාල වයස්කාර දරුවකුට මුදල් හෝ වෙනත් ආධාර

මණ්ඩලය වෙත ඉල්ලීමක් කරනු ලැබූ විට පිරිනැමීම **විය යුතුය.**

භාරයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය

6. (1) භාරයේ පරමාර්ථ ඉෂ්ට කිරීමට අවශ්‍ය වන්නාවූ හෝ හිතකර වන්නාවූ හෝ ආනුෂංගික වන්නාවූ සියලු ක්‍රියා මේ පනතේ සහ වෙනත් යම් ලිඛිත නීතියක විධිවිධානවලට යටත්ව භාරයේ නාමයෙන් කිරීමේ බලය මණ්ඩලයට ඇත්තේ ය.

(2) (1) වන උපවගන්තියෙන් පිරිනැමී ඇති බලතලවල ව්‍යාප්තියට හානියක් නොමැතිව, පහත සඳහන් බලතල සහ කර්තව්‍යයන් ක්‍රියාත්මක කිරීම සහ ඉටු කිරීම මණ්ඩලය විසින් කරනු ලැබිය හැකි ය :—

(අ) මුදල් සපයා ගැනීම හෝ දේශීය නැතහොත් විදේශීය ප්‍රභවයන්ගෙන් මුදලින් හෝ භාණ්ඩ වශයෙන් හෝ ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග භාර ගැනීම ;

(ආ) චංචල හෝ නිශ්චල දේපළ අත්කර ගැනීම, දැරීම, බද්දට හෝ උකසට ගැනීම හෝ දීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන් ආකාරයකින් බැහැර කිරීම ;

(ඇ) භාරයේ බලතල ක්‍රියාත්මක කිරීම, කර්තව්‍යයන් හා කාර්ය යන් ඉටු කිරීම සහ භාරයේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීම සඳහා අවශ්‍ය වන සියලු ගිවිසුම්වලට සහ එකඟවීම්වලට කෙළින්ම හෝ නිලධරයන් සහ සේවකයන් නැතහොත් මණ්ඩලය විසින් ඒ සඳහා ලියවිල්ලකින් බලය දෙන ලද අනුයෝජිතයන් මගින්, ඇතුළත්වීම සහ ඒ ගිවිසුම් සහ එකඟවීම් ඉටුකිරීම ;

(ඈ) මේ පනතේ විධිවිධානවලට යටත්ව, භාරයේ නිලධරයන් සහ සේවකයන් පත් කිරීම, සේවයෙහි නියුක්ත කිරීම සහ ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම සහ එහි සේවානියුක්ත යන්ගේ පත්කිරීම, උසස් කිරීම, පාරිශ්‍රමික ගෙවීම සහ විනය පාලනය ද ඔවුන්ට නිවාඩු සහ වෙනත් ප්‍රතිලාභ සැලසීම ද පිළිබඳ රීති සෑදීම ;

(ඉ) භාර මුදල් ආයෝජනය කිරීමට නීතියෙන් අවසර දී ඇති කවර වූ හෝ ආයෝජනවල, මණ්ඩලයේ අභිමතය පරිදි භාරයට අයත් මුදල් ආයෝජනය කිරීම සහ මණ්ඩලයේ අභිමතය පරිදි, ඒ ආයෝජන ආපසු ලබා ගැනීම, නැවත ආයෝජනය කිරීම, ඒ ආයෝජන වෙනස් කිරීම සහ ඒ ආයෝජනවලින් උපචිත වන ආදායම අයකර ගැනීම ;

(ඊ) භාරය පරිපාලනය කිරීම පිළිබඳ සියලු කරුණු සම්බන්ධ යෙන් රීති සෑදීම ; සහ

(උ) භාරයේ පරමාර්ථ ඉෂ්ට කර ගැනීම සඳහා අවශ්‍ය වෙතැයි හෝ හිතකර වෙතැයි මණ්ඩලය සලකන වෙනත් ක්‍රියා සහ දේවල් කිරීම.

7. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) ජාතික චිත්‍රපට සංස්ථා භාර අරමුදල යනුවෙන් හැඳින්වෙන අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු ය. ජාතික චිත්‍රපට සංස්ථා භාර අරමුදල පිහිටුවීම.

(2) අරමුදලේ කළමනාකරණය, පාලනය සහ ක්‍රියාත්මක කිරීම පිළිබඳ බලතල මණ්ඩලයට තිබිය යුතු ය.

(3) මේ පනත ක්‍රියාත්මක වීම ආරම්භ වන දිනයෙන් පසු හැකි තාක් ඉක්මණින් චිත්‍රපට සංස්ථාව විසින් අරමුදලට ආරම්භක ප්‍රදානයක් වශයෙන් රුපියල් දස ලක්ෂයක ගෙවීමෙන් කළ යුතු ය.

(4) (3) වන උපවගන්තියෙහි සඳහන් ආරම්භක ප්‍රදානය කරන ලද අවුරුද්දට අනතුරුව එළඹෙන අවුරුද්දෙන් ආරම්භව, වාර්ෂික ප්‍රදානයක් චිත්‍රපට සංස්ථාව විසින් අරමුදල වෙත ගෙවනු ලැබීම නීත්‍යනුකූල වන්නේ ය.

අරමුදලට කෙරෙන ගෙවීම්.

8. අරමුදලට—

(අ) 6 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ සපයා ගන්නා ලද යම් මුදලක් හෝ ලැබුණු ප්‍රදාන, තෑගි හෝ පරිත්‍යාග හෝ ලබාගත් හෝ අයකර ගත් මුදල් ;

(ආ) 7 වන වගන්තිය යටතේ චිත්‍රපට සංස්ථාව විසින් ගෙවන ලද ආරම්භක ප්‍රදානය සහ වාර්ෂික ප්‍රදාන ; සහ

(ඇ) ආයෝජනවලින් ලැබෙන යම් ආදායමක් හෝ භාරය වෙත ලැබිය යුතු වෙනත් මුදල්

ගෙවනු ලැබිය යුතු ය.

අරමුදලින් කෙරෙන ගෙවීම්.

9. අරමුදලින්—

(අ) භාරයේ ක්‍රියාකාරිත්වය, පිහිටුවීම සහ පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය වියදම් දැරීම ;

(ආ) නිලධරයන්ට, සේවකයන්ට සහ වෙනත් සේවා නියුක්තයන්ට වැටුප් ගෙවීම ; සහ

(ඇ) භාරයේ පරමාර්ථ ක්‍රියාවේ යෙදවීමේ කාර්යය සඳහා අවශ්‍ය වේතැයි මණ්ඩලය විසින් අනුමත කරනු ලබන වෙනත් සියලු ගෙවීම්

කරනු ලැබිය යුතු ය.

භාරයේ මුදල් වර්ෂය.

10. භාරයේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය.

ගිණුම් සහ විගණනය.

11. (1) මණ්ඩලය, භාරයේ ආදායම හා වියදම සහ වෙනත් සියලු ගනුදෙනු සම්බන්ධයෙන් නිසි ගිණුම් පොත් පවත්වාගෙන යාමට සැලැස්විය යුතු ය.

(2) එක් එක් වර්ෂයේ දෙසැම්බර් මාසයේ 31 වන දා පවත්නා තත්ත්වය අනුව මණ්ඩලයේ ගිණුම් පොත් තුලනය කිරීමට ද එකී දිනය දක්වා සකස් කරන ලද ආදායම සහ වියදම පිළිබඳ ගිණුමක් සහ භාරයේ වත්කම් සහ බැරකම් පිළිබඳ සාරාංශයක් ඇතුළත් ශේෂ පත්‍රයක් ඊළඟ මාර්තු මාසයේ 31 වන දිනට පෙර පිළියෙල කිරීමට ද මණ්ඩලය විසින් සැලැස්විය යුතු ය.

(3) ආදායම හා වියදම පිළිබඳ ගිණුමට සහ ශේෂ පත්‍රයට අත්සන් කිරීම සඳහා මණ්ඩලය විසින් සම්මත කරන ලද යෝජනාවක් මගින් බලය දෙන ලද මණ්ඩලයේ සාමාජිකයන් දෙදෙනකු විසින් ඊට අත්සන් කරනු ලැබිය යුතු ය.

(4) ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 වන ව්‍යවස්ථාවට අනුකූලව විගණකාධිපතිවරයා විසින් භාරයේ ගිණුම් සෑම වර්ෂයක දී ම විගණනය කරනු ලැබිය යුතු ය.

මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කෙරෙන ක්‍රියා සඳහා ආරක්ෂාව.

12. (1) මණ්ඩලයේ යම් සාමාජිකයකු විසින් හෝ මේ පනතේ කාර්ය සඳහා පත් කරන ලද භාරයේ යම් නිලධරයකු, සේවකයකු හෝ අනුයෝජිතයකු විසින් හෝ මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධිවිධාන මත හෝ සද්භාවයෙන් කරන ලද නැතහොත් කෙරෙතැයි ඇඟවුණු යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව කිසිම සිවිල් හෝ අපරාධ නඩුවක් නොපවරනු ලැබිය යුතු ය.

(2) භාරය විසින් හෝ භාරයට විරුද්ධව හෝ යම් අධිකරණයක පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී භාරය දැරූ යම් වියදමක් භාරයේ අරමුදලින් ගෙවිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී භාරය වෙත ගෙවන ලද හෝ භාරය විසින් අය කර ගන්නා ලද යම් ගාස්තු භාරයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තියෙහි සඳහන් යම් තැනැත්තකු විසින් මේ පනත යටතේ හෝ මණ්ඩලයේ විධානය මත කරන ලද නැතහොත් කෙරෙතැයි ඇඟවුණු යම් ක්‍රියාවක් සම්බන්ධයෙන් ඔහුට විරුද්ධව යම් අධිකරණයක පවරන ලද යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී ඔහු විසින් දරන ලද යම් වියදමක්, ඒ ක්‍රියාව සද්භාවයෙන් කරන ලද බව ඒ අධිකරණය තීරණය කළහොත්, ඒ වියදම ඔහු විසින් ඒ සිවිල් හෝ අපරාධ නඩුවේ දී අය කරගනු ලැබුවේ නම් මිස, භාරයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු ය.

පෞද්ගලිකව, මණ්ඩලයේ සාමාජිකයකුට හෝ භාරයේ නිලධරයන් ආදීන්ට හෝ විරුද්ධව නැතහොත් එවැන්නකුගේ දේපළට විරුද්ධව රිට් ආඥාවක් නිකුත් නොකළ යුතු බව.

13. (1) භාරයට විරුද්ධව පවරනු ලැබූ යම් නඩුවක දී පෞද්ගලික වශයෙන් මණ්ඩලයේ යම් සාමාජිකයකුට විරුද්ධව හෝ භාරයේ යම් නිලධරයකුට නැතහොත් සේවකයකුට විරුද්ධව හෝ එවැන්නකුගේ දේපළට විරුද්ධව හෝ කිසිම රිට් ආඥාවක් නිකුත් නො කරනු ලැබිය යුතු ය.

(2) භාරය විසින් හෝ භාරයට විරුද්ධව හෝ යම් අධිකරණයක පවරන ලද සිවිල් හෝ අපරාධ නඩුවක දී, භාරය දැරූ යම් වියදමක් භාරයේ අරමුදලින් ගෙවනු ලැබිය යුතු අතර, එවැනි යම් සිවිල් හෝ අපරාධ නඩුවක දී භාරය වෙත ගෙවන ලද හෝ භාරය විසින් අය කර ගන්නා ලද හෝ යම් ගාස්තු භාරයේ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

භාරයේ නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහය යටතේ රජයේ සේවකයන් ලෙස සැලකෙන බව.

14. භාරයේ සියලු නිලධරයන් සහ සේවකයන් දණ්ඩ නීති සංග්‍රහයේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා රජයේ සේවකයන් ලෙස සලකනු ලැබිය යුතු ය.

අල්ලස් පනතේ අර්ථානුකූලව භාරය උපලේඛනගත ආයතනයක් ලෙස සැලකෙන බව.

**15.** භාරය අල්ලස් පනතේ අර්ථානුකූලව උපලේඛනගත ආයතනයක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ පනතේ විධිවිධාන අදාළ විය යුතු ය.

අර්ථ නිරූපණය.

**16.** පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි—

"සුදුසුකම් ලැබූ චිත්‍රපට කලාකරුවා හෝ කාර්මිකයා" යන්නෙන්, ගිවිසුම් පදනමක් මත අවම වශයෙන් චිත්‍රපට තුනක් නිපදවීමෙහි ලා නිරත වීමෙහි ප්‍රතිඵලයක් වශයෙන් අවුරුදු දහයකට අඩු නොවන කාලසීමාවක් තුළ දී ශීර්ෂ පාඨ සඳහන් කිරීම් ලබා සිටින (මෙවැනි අවශ්‍යතාවක් අදාළ නොවන ගීත රචකයකු, ආලෝක කාර්මිකයකු හෝ පසුබිම් ගායකයකු නොවන) චිත්‍රපට කලාකරුවකු හෝ කාර්මිකයකු අදහස් වේ;

"චිත්‍රපට කලාකරුවා සහ කාර්මිකයා" යන්නට නළුවකු, චිත්‍රපට අධ්‍යක්ෂවරයකු, පිටපත් රචකයකු, ගීත රචකයකු, සංගීත අධ්‍යක්ෂවරයකු, පසුබිම් ගායකයකු, වේශ නිරූපන ශිල්පියකු, කලා අධ්‍යක්ෂවරයකු, කැමරා ශිල්පියකු, සංස්කාරකයකු හෝ ආලෝක කාර්මිකයකු වශයෙන් ශ්‍රී ලංකාවේ චිත්‍රපට නිෂ්පාදනයෙහි කෙළින්ම නිරත වූ හෝ නිරතව සිටින තැනැත්තකු ඇතුළත් විය යුතු ය;

"චිත්‍රපට සංස්ථාව" යන්නෙන්, 1971 අංක 47 දරන ජාතික චිත්‍රපට සංස්ථා පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා ජාතික චිත්‍රපට සංස්ථාව අදහස් වේ.

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ නීතිවල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.